# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යංශය

# ඇබෑර්තු

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පවත්නා පහත සඳහන් තනතුරු පිරවීම සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. කාර්යාල සහයක - තනතුරු 03**

**02. බස් කොන්දොස්තර සහ කාර්යාල සහයක - 01**

**රැකියා විස්තරය :**

**කාර්යාල සහයක**

- අභ්‍යන්තර තැපැල් එකතු කර බෙදා හැරීම.
- ලැබුණු තැපැල් ලේඛනය පවත්වාගෙන යාම.
- කාර්යාලය පිරිසිදුව හා පිළිවෙලට තබා ගැනීම.
- ක්ෂේත්‍ර ලේඛන සොයා ගැනීමට කළමනාකරණ සහායකයින්ට සහාය වීම.
- අනෙකුත් සමාන ශ්‍රේණි සමඟ විශ්වවිද්‍යාලයේ පොදු ගොඩනැගිලි සහ භූමිය පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම.
- අංශ ප්‍රධානියා, අධ්‍යක්ෂ ජනරාල් හෝ උපකුලපතිවරයා විසින් පවරන ලද වෙනත් ඕනෑම කාර්යයක්.

**බස් කොන්දොස්තර සහ කාර්යාල සහායක**

- බස් රියදුරුට සහාය වීම.
- බස් රථය දිනපතා පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම.
- අනෙකුත් සමාන ශ්‍රේණි සමඟ විශ්වවිද්‍යාලයේ පොදු ගොඩනැගිලි සහ භූමිය පිරිසිදු කිරීම සහ නඩත්තු කිරීම.
- දෙපාර්තමේන්තු ප්‍රධානියා, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් පවරන ලද වෙනත් ඕනෑම කාර්යයක්.

**පත්වීමේ ස්වභාවය :**

- ස්ථිර පදනමින් වන අතර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාර අරමුදලට දායකත්වය හිමි වේ.

**සුදුසුකම් :**

- අධ්‍යාපනික : අ.පො.ස. (සා/ පෙළ) විභාගය සඳහා ලියූ හා අවම විෂයන් දෙකක් සමත් අය

**වයස :**

- අවුරුදු 18 නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය :**

- U – PL1 – 2025 : 42,775 – 10*450 – 10*549 – 10*540 – 12*640 – 65,255/= (මසකට)

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 2025.03.25 දිනැති අංක 06/2025 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවීම සිදුකෙරේ.)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පත්කිරීම සිදු කරනු ලබන අතර, තෝරා ගැනීම අදාළ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා කුසලතා අනුපිළිවෙල අනුව සිදුකෙරේ.

**සෑම අයදුම්කරුවෙක් ම :**

I ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II තනතුරට අදාළ ව රාජකාරි නිසි අයුරින් ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි වන සේ මනා මානසික හා ශාරීරික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

III මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**පොදු උපදෙස් :**

- මෙම තනතුරු සඳහා ස්ථාන මාරු වීම් අදාළ නැත.
- මෙම තනතුරු එකකට වඩා අයදුම් කිරීමට අදහස් කරනු ලබන අයදුම්කරුවන් ඒ සඳහා වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.
- යම් අයදුම්කරුවෙකු මෙම තනතුරක් සඳහා තෝරාගතහොත් දැනට යම් ආයතනයක සේවය කරන්නේ නම් එම ආයතනයේ ප්‍රධානියා වෙතින් දරනු ලබන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ සඳහන් කොට ලිපියක් ඉදිරිපත් කල යුතුය.
- නියමිත (විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත කළ) අයදුම්පත් යථා පරිදි සම්පූර්ණ කොට අදාළ පළපුරුද්ද, අධ්‍යාපනික සුදුසුකම් හා අනෙකුත් ලැබූ ජයග්‍රහණ සම්බන්ධ සාක්ෂි සමඟ ඉදිරිපත් කළ යුතුය.
- සම්පූර්ණ කළ අයදුම්පත් මුද්‍රා තැබූ කවරයක බහා, උපකුලපති (වැඩ බලන), වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, අංක 100, කඳවල, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාර දීමෙන් ඉහත ලිපිනය වෙත 2025 දෙසැම්බර් 02 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.
- අසම්පූර්ණ ව ඉදිරිපත් කරනු ලබන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.
- බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- තෝරා ගැනීමේ ක්‍රමවේදයට යම් බලපෑම් සිදු කිරීමට උත්සහ ගැනීම නුසුදුසුකමක් සේ සැලකීමට සිදුවනු ඇත.

**වැඩ බලන උපකුලපති**
**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය**
**නො.100, කඳවල**
**රත්මලාන.**

**011-2630704**
**www.uovt.ac.lk**

**2025 නොවැම්බර් 02**